කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර

බහුවරණ ප්‍රශ්න සංග්‍රහය

විෂය- ඉතිහාසය

ශ්‍රේණිය - 13

සකස් කළ ගුරුභවතාගේ නම - ඉන්දික අලුත්වත්ත මයා

පාසල - ර/නුගදණ්ඩ ම.වි.

පාඩම - පශ්චාත් මෞර්ය යුගය හා විදේශීය දේශපාලන බලය

- 1,2 ප්‍රශ්න සඳහා දී ඇති නම් අතරින් එකක් කවර හෝ හේතුවක් නිසා නොගැළපේ.එම නොගැළපෙන නාමය තෝරන්න.

1.) 1.ශාතකරණී
2.ශ්වාතකරණී
3.ශක්තිවර්ණී
4.ආන්ධ්‍රජාති
5.සසේනියත්

2.) 1.ගෞතමී පුත්‍ර
2.වශිෂ්ඨ පුත්‍ර ශ්‍රී
3.යැඳ ශ්‍රී
4.සී මුක
5.සුසිරමත්

3.) අශෝක රජුගෙන් පසුව අශ්වමේධ යාග දෙකක් පවත්වමින් දිග්විජය ප්‍රතිපත්තිය අනුගමනය කළේ යයි සඳහන් වන රජු,

1. අග්නි මිත්‍ර රජු
2. පුෂ්‍ය මිත්‍ර රජු
3. බෘහද් රථ රජු
4. වසු මිත්‍ර රජු
5. දේව භූති රජු

4.) උතුරු ඉන්දියාවේ හා වයඹ දිග ඉන්දියාවේ විශාල ප්‍රදේශයක් යටත් කර සියල්කෝට් අගනගරය කරගෙන ඉන්දියාව පාලනය කළ ඉන්දු ග්‍රීක රජු,

1. මිනැන්ඩර්
2. ඩිමෙට්‍රියස්
3. සෙලියුකස් නිකේටර්
4. ඩියොඩෝටස්
5. යුක්‍රටයිඩීස්

5.) ලෙන් විහාර අතරින් විශිෂ්ටම නිර්මාණය වන්නේ,

1. කාර්ලේ
2. නාසික්
3. එල්ලෝරා
4. උදයගිරි
5. අජන්තා

6.) පෙරදිග ජාත්‍යන්තර භාෂාව බවට පත් වූ භාෂාව වූයේ,

1. පාලි
2. සංස්කෘත
3. මහාරාෂ්ට්‍රි
4. ශෞරසෙනි
5. අර්ධමාගදී

7.) චීනය,ජපානය,කොරියාව වැනි රටවලද බෞද්ධ කලාව පෝෂණය කළ කලා සම්ප්‍රදාය වන්නේ,

1. ගාන්ධාර කලා සම්ප්‍රදාය
2. මථුරා කලා සම්ප්‍රදාය
3. ගුප්ත කලා සම්ප්‍රදාය
4. පල්ලව කලා සම්ප්‍රදාය
5. ඔරිස්සා කලා සම්ප්‍රදාය

8.) නොගැළපෙන යුගලය තෝරන්න.

1. රුද්‍රදාමන් - ජුනාගාද් සෙල්ලිපිය
2. කණිෂ්ක - සාංචි සෙල්ලිපිය
3. නාගනිකා - නානසාත් සෙල්ලිපිය
4. I ශාතකරණි - හත්පීගුම්ඵා සෙල්ලිපිය
5. වාශිෂ්ක - ගිර්නාර් සෙල්ලිපිය

- අංක 9 සහ 10 ප්‍රශ්න සඳහා එක් මාතෘකාවක් යටතේ කරුණු 5 බැගින් දී ඇත.ඒ අතරින් එකක් මාතෘකාවට නොගැළපේ.එය තෝරන්න.

9.) කනිෂ්ක රජුගේ බල ව්‍යාප්තිය

1. කනිෂ්ක රජු සාකේත හා පාටලීපුත්‍ර පාලකයන් හා සටන් වැද ජයගත් බව ටිබෙට් ලේඛනවල දැක්වේ.
2. සාරානාත් ලිපියට අනුව ඔහුගේ බලය බරණැස තෙක් විහිදී පැවතිණි.
3. ඔහු මධ්‍ය ආසියාව ජයගත් බව මණික්යාල හා සෙඩා සෙල්ලිපිවල සඳහන් වේ.
4. බටහිර ඉන්දියාව ජයගත් බව පෙරිප්ලස් ග්‍රන්ථයේ සඳහන් වේ.
5. කාශ්මීර ප්‍රදේශය කනිෂ්කගේ පාලනය යටතේ පැවති බව හියුංසාංගේ දේශාටන වාර්තාවල සඳහන් වේ.

10.) සාතවාහන යුගයේ සංස්කෘතිය,

1. සාතවාහන රජුන්ගේ වැඩි අනුග්‍රහය හින්දු ආගමට ලැබිණි.
2. ප්‍රසිද්ධ අමරාවතී ස්තූපය විශාල කොට නව අංග එකතු කළේය.
3. අංක 8,9,10,12,13 දරණ අජන්තා ලෙන් සාතවාහන සමයට අයත්ය.
4. සංස්කෘත හා ප්‍රකෘත භාෂාවලින් සාහිත්‍ය කටයුතු සිදු විය.
5. හතරවන ධර්ම සංගායනාව සිදු වූයේ මේ යුගයේදීය.

## <u>පිළිතුරු පත්‍රිකාව</u>

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1 | 5 | 6 | 2 |
| 2 | 5 | 7 | 1 |
| 3 | 2 | 8 | 5 |
| 4 | 1 | 9 | 3 |
| 5 | 1 | 10 | 5 |